# ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සේවා නියුක්තිය

# සහ

# අධ්‍යාපන මට්ටම







**M.B.ඉරෝෂිකා බණ්ඩාර**

**මිනිස්බල සැලසුම් සංවර්ධන හා පර්යේෂණ අංශය**

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකාය තුළ සිටින පිරිසෙහි සේවා වියුක්තිය විවිධ මට්ටම් වලට සහ ස්ත්‍රී පුරුෂ භාවය අධ්‍යාපන මට්ටම ආදියට අදාලව හදුනාගත හැක.

වර්තමාන සමාජය තුළ දැනුම මත පදනම් වන එකතු කළ මානව ගුණාංග සහිත පූර්ව තත්ත්ව කළමණාකරණ මාවතකට යොමුවීමත් සමඟ අධ්‍යාපනය මඟින් නිමැවෙන විද්‍යාර්ථියා තුළ දියුණු කුසලතා හා සංවර්ධනය කරගත හැකි ආකල්ප සහිත හැකියාවන් වැඩ ලෝකය විසින් අපේක්ෂා කරයි.ඕනෑම ශ්‍රමිකයෙකු තුළ දැනුම කුසලතා නිපුණතා ආකල්ප අත්දැකීම් හා පළපුරුද්ද යන අංශ වලින් පෝෂණය වීමෙන් ඔහු ප්‍රාග්ධනිතයෙක් බවට පත්වෙයි.මානව ප්‍රාග්ධනය රටක නිෂ්පාදන ධාරිතාව ඉහළ නැංවීමට අත්‍යාවශ්‍ය සජීවි සාධකයකි.ස්ත්‍රී පුරුෂ භාවය අනුව වැඩ ලෝකයේ රැකියා අවස්ථා නොලැබීම ශ්‍රී ලංකාව තුළ උගත් තරුණ විරැකියාව සමාජ ගැටලුවක් වී ඇත.ඒ අනුව වර්තමානයේ ශ්‍රී ලංකාවේ ස්ත්‍රී,පුරුෂ සේවා නියුක්තිය සහ අධ්‍යාපන මට්ටම පිළිබඳ ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව, අධ්‍යාපන අමාත්‍යාංශය,මහ බැංකු වාර්තාව 2017, World Employment Social outlook –trends 2017 ලබා ගත් තොරතුරු අනුව මෙම වාර්තාව සකස් කරන ලද අතර ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂ සේවා නියුක්තිය අධ්‍යාපන මට්ටමට ශ්‍රම වෙළඳපොළ ඉල්ලුම සැපයුම සහ නිපුණතාවය තුළ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ස්ත්‍රී පුරුෂ සේවා නියුක්තිය ඇති කිරීම යන කරුණු මෙම වාර්තාවේ අන්තර්ගතය වෙයි.

## ශ්‍රී ලංකාවේ ස්ත්‍රී/පුරුෂ සේවා නියුක්තිය  සහ අධ්‍යාපන මට්ටම

ආර්ථික විද්‍යාත්මක පර්යේෂණ සහ න්‍යායන් මඟින් අධ්‍යාපනය තුළින් ලැබෙන ප්‍රතිලාභ පිළිබඳ පැහැදිලි විග්‍රහයන් ඉදිරිපත් කරයි. අධ්‍යාපනය පරිපූර්ණ මිනිසෙක් බිහි කිරීමට අවශ්‍ය ඉගෙනීම,ඇගයීම,පුහුණුව ලබා දෙයි.අධ්‍යාපන මට්ටම් රැකියාවන් සහ ආදායම සමඟ එකිනෙක සබඳතාවයක් දක්වයි.ශ්‍රී ලංකාවේ ස්ත්‍රීන්ගේ අධ්‍යාපන මට්ටම පැහැදිලි සාර්ථකත්වයක් ලබා තිබුණද සාර්ථක සේවා නියුක්ති දායකත්වයක් දක්වා වර්ධනය කර ගැනීම අභියෝගයක් බවට පත් වී ඇත.පසුගිය වර්ෂයන් තුළ ස්ත්‍රී ශ්‍රම  බලකා දායකත්ව අනුපාතය පහළ වැටී අතර උගත් ස්ත්‍රීන් සහ පුරුෂයන්ගේ සේවා නියුක්ති තත්ත්වය තුළද පැහැදිලි පරතරයක් දක්නට ලැබෙයි.

ශ්‍රී ලංකාවේ ස්ත්‍රීන්ගේ අධ්‍යාපන සහභාගීත්වය ඉහළ සාර්ථකත්වයක් අත්කර ගැනීමට සමත් වී ඇත.ප්‍රාථමික අධ්‍යාපන සහභාගීත්ව අනුපාතයන් තුළ  ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශවයම එක හා සමාන තලයක පවතියි.ඉහළ අධ්‍යාපන සාධන මට්ටම තුළ ස්ත්‍රීන් පුරුෂයන් අභිබවා යාමට සමත්ව ඇත.(උදා:2017)වර්ෂයේදී උසස්පෙළ විභාගයට අපේක්ෂකයන්ගෙන් 58%ක් කාන්තාවන් වූ අතර විශ්ව විද්‍යාල ප්‍රවේශයට සුදුසුකම් ලැබූවන්ගෙන් 67%ක් පමණඉහළ ප්‍රතිශතයක් පමණ අත්කර ගැනීමට කාන්තාවන් සමත්ව ඇත.

### ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය

| වර්ෂය | ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය | | |
|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | සමස්ත |
| 2011 | 74.0 | 34.3 | 52.9 |
| 2012 | 74.9 | 32.9 | 52.5 |
| 2013 | 74.9 | 35.4 | 53.7 |
| 2014 | 74.6 | 34.6 | 53.2 |
| 2015 | 74.7 | 35.9 | 53.8 |
| 2016 | 75.1 | 35.9 | 53.8 |
| 2017 | 74.5 | 36.6 | 54.1 |

මූලාශ්‍රය : ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

**අධ්‍යාපන මට්ටම අනුව ආර්ථිකමය වශයෙන් අක්‍රීය ජනගහනය - 2017**

| අධ්‍යාපන මට්ටම | සමස්ත | ස්ත්‍රී පුරුෂ භාවය | |
|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී |
| එකතුව | 100.0 | 100.0 | 100.0 |
| 5 ශ්‍රේණිය දක්වා | 19.1 | 18.6 | 19.3 |
| 6 - 10 ශ්‍රේණිය | 44.8 | 43.5 | 45.2 |
| අ.පො.ස. (සා.පෙළ) | 23.0 | 25.8 | 22.0 |
| අ.පො.ස. (උ.පෙළ) සහ ඉහළ | 13.0 | 12.0 | 13.3 |

*මූලාශ්‍රය : ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව*




මූලාශ්‍රය : ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව-(LFS )(2017)

අධ්‍යාපනය තුළ දක්නට ලැබෙන ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය සේවා නියුක්තිය තුළ දක්නට නොලැබෙයි. ස්ත්‍රීන් අධ්‍යාපනය තුළ (ද්වීතික මට්ටමේදී)පුරුෂයන් අභිබවා ගියත් කාන්තා ශ්‍රම බලකා දායකත්ව අනුපාතය **36.6% ක** අඩු අගයක් ගනියි.මෙම අනුපාතය පසුගිය වසර දෙක තුළ ක්‍රමික අඩුවීමක් දක්වන අතර එය ලෝකයේ සහ ආසියාතික කලාපයේ අනෙකුත් රටවලට සාපේක්ෂවද අඩුමට්ටමක් ගනියි. ශ්‍රී ලංකාවේ පුරුෂ ශ්‍රම සහභාගිත්ව අනුපාතය **74.5%** ක් ගනියි.(වගු 03) ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතයක් ලෙස 2016දී 35.9ක් වූ අතර පුරුෂ ශ්‍රම බලකා සහභාගීත්වය 75.1 ක් විය. ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකයේ සුළු වර්ධනයක් පමණක් වීම නිසා සමස්ත ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය 2017 වර්ෂයේදීද 54.1% ක ප්‍රතිශතයක් වෙයි.

| | 2015 | | | 2016 | | | 2017 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | සමස්ත | පුරුෂ | ස්ත්‍රී | සමස්ත | පුරුෂ | ස්ත්‍රී | සමස්ත |
| ලෝකය | 76.1 | 49.5 | 62.9 | 76.1 | 49.57 | 62.8 | 75 | 49 | 62.0 |
| දකුණු ආසියාව | - | - | 54.5 | 76 | 29 | 54.4 | 79 | 28 | 55.0 |
| ශ්‍රී ලංකාව | 53.8 | 36.0 | 53.8 | 75.1 | 36.0 | 53.8 | 74.5 | 36.6 | 54.1 |

මූලාශ්‍රය : ගෝලීය සේවා නියුක්ති ප්‍රවණතා - (ජාත්‍යන්තර කම්කරු සංවිධානය) World Employment Social Outlook-Trends 2017 https//data.worldbank.org/indicators/SLTF.CACT.MA.ZS

**<u>සේවා වියුක්ති අනුපාතය(%)</u>**

| වර්ෂය | 2016 | 2017 |
|---|---|---|
| පුරුෂ | 2.9 | 2.9 |
| ස්ත්‍රී | 7.0 | 6.5 |
| සමස්ත | 4.4 | 4.2 |

මූලාශ්‍රය : ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

**<u>අධ්‍යාපන මට්ටම් අනුව සේවා වියුක්ති අනුපාතය - 2017</u>**

**(වගු 01)**

| අධ්‍යාපන මට්ටම | සමස්ත | ස්ත්‍රී | පුරුෂ |
|---|---|---|---|
| අ.පො.ස (සා.පෙළ) දක්වා | 2.3 | 3.5 | 1.7 |
| අ.පො.ස (සා.පෙළ) සමත් | 5.9 | 7.9 | 4.8 |
| අ.පො.ස (උ.පෙළ) සහ ඉහළ | 8.1 | 11.3 | 5.0 |
| සමස්ත | 4.2 | 6.5 | 2.9 |

මූලාශ්‍රය : ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව-(LFS )(2017)

2016 වසරේ 7.0 ක්ව පැවති ස්ත්‍රී සේවා වියුක්ති අනුපාතිකය 2017 වසරේදී 6.5% ක් දක්වා පහළ ගියේය. සමස්ත සේවා වියුක්ති අනුපාතිකය අඩු අගයක් පැවතියද තරුණයන් අධ්‍යාපන සුදුසුකම් සහිත පුද්ගලයින් සහ ස්ත්‍රීන්ගේ සේවා වියුක්තිය තවමත් ඉහළ මට්ටමක පවතියි.

**<u>ඌණ සේවා නියුක්තිය(%)ස්ත්‍රී පුරුෂ භාවය අනුව (2017</u>**




2017 වර්ෂයේදී සමස්ත ඌණ සේවා නියුක්ති ප්‍රතිශතය 2.8 ක් වන අතර පුරුෂ ඌණ සේවා නියුක්තිය 2.2ක් වෙයි.ස්ත්‍රී ඌණ සේවා නියුක්තිය 3.9 ක ප්‍රතිශත අගයක් ගනියි.

## <u>අවිධිමත් අංශයේ සේවා නියුක්තිය</u>




මූලාශ්‍රය : ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව-(LFS )(2017)

2017 වර්ෂයේ ශ්‍රී ලංකාවේ අවිධිමත් අංශයේ සේවා නියුක්තියේ සමස්තය 68.1 ක් වන අතර පුරුෂ සේවා නියුක්තිය 64.3ක් වෙයි. ස්ත්‍රී සේවා නියුක්තිය 35.7ක් වෙයි.මෙහිදී පැහැදිලි වන්නේ ද අවිධිමත් අංශයේද ස්ත්‍රී ශ්‍රම දායකත්වය පුරුෂ ශ්‍රම දායකත්වයට වඩා පහළ ප්‍රතිශතයක් ගන්නා බවයි.

ද්විතියික රැකියා සහිතව ලංකාවේ සමස්ත රැකියා සංඛ්‍යාව 8,900,297 ක් වන අතර එය සංඛ්‍යාත්මකව පුරුෂ 5,785,377 ක්ද ස්ත්‍රී 3,114,920 වෙයි.

රැකියා තත්ත්වය සහ ස්ත්‍රී පුරුෂ භාවය අනුව ද්විතීයික රැකියා ප්‍රතිශතය 2017 වර්ෂයේදී පහත පරිදි වෙයි.

| සේවා තත්ත්වය | | ස්ත්‍රී | පුරුෂ |
|---|---|---|---|
| **සමස්තය** | **692,118** | **73.1** | **26.9** |
| **සේවකයන්** | **115,110** | **79.5** | **20.5** |
| **සේවා යෝජකයන්** | **20,823** | **80.1** | **19.9** |
| **ස්වයං ව්‍යාපාරිකයන්** | **430,828** | **80.8** | **19.2** |
| **දායකත්වය දක්වන පවුලේ ශ්‍රමිකයන්** | **125,356** | **39.7** | **60.3** |

## අධ්‍යාපන මට්ටම අනුව සමස්තයක් ලෙස රැකියා බෙදී යාම - 2017

| අධ්‍යාපන මට්ටම | ප්‍රධාන රැකියා | % | ද්විතියික රැකියා | % | සමස්ත රැකියා | % |
|---|---|---|---|---|---|---|
| සමස්තය | 8,208,179 | 100.0 | 692,118 | 100.0 | 8,900,297 | 100.0 |
| 5 ශ්‍රේණිය හා පහළ | 1,299,892 | 15.8 | 143,900 | 20.8 | 1,443,792 | 16.2 |
| 6-10 ශ්‍රේණිය | 3,782,967 | 46.1 | 338,198 | 48.9 | 4,121,165 | 46.3 |
| අ.පො.ස. (සාමාන්‍ය පෙළ) | 1,420,549 | 17.3 | 97,167 | 14.0 | 1,517,716 | 17.0 |
| අ.පො.ස. (උසස් පෙළ) | 1,704,771 | 20.8 | 112,853 | 16.3 | 1,817,623 | 20.4 |

## ශ්‍රී ලංකාවේ ස්ත්‍රී පුරුෂභාවය අනුව රැකියා බෙදී යාමේ ප්‍රතිශතය - 2017




ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව-LFS (2017

**ශ්‍රම වෙළඳපොළ ඉල්ලුම සහ සැපයුම**

ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්වය අඩුවීමටත් උගත් ස්ත්‍රීන්ගේ රැකියා වියුක්තිය ඉහළ මට්ටමක පැවතීමට බලපාන කරුණු ද ඇත.මේ විශ්ලේෂණය අනුව දත්ත මඟින් ස්ත්‍රී පුරුෂසේවා නියුක්තියේ විෂමතාවයක් දක්නට ලැබෙයි.පෞද්ගලික අංශයේ සේවා නියුක්තිය තුළ ස්ත්‍රී පුරුෂ භාවය අනුව විශාල පරතරයක් පවතින අතර උසස් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ කාන්තාවන් හා පුරුෂයන් ලබා ගන්නා නිපුණතාවන්හි බෝහෝ වෙනස්කම් පවතියි. 2017 වර්ෂය තුළ රාජ්‍ය අංශයේ 528,489 රැකියා අවස්ථාවන් ස්ත්‍රීන්ට ලබා දෙන අතර පෞද්ගලික අංශයේ ස්ත්‍රී සේවා නියුක්තිය 1,103,489 ක් විය.ඒ අනුව ශ්‍රී ලංකාවේ සේවා නියුක්තිය සඳහා ඉහලම දායකත්වයක් පෞද්ගලික අංශය ලබාදෙයි.එනම් 40%ක් පෞද්ගලික අංශය සහ 15%ක් රාජ්‍ය අංශය ලෙසිනි. නමුත් කාන්තාවන්ට රැකියා අවස්ථා ලබා දීමේදී පෞද්ගලික අංශය අඩු දායකත්වයක් ලබාදෙන අතර රාජ්‍ය අංශය තුළ කාන්තාවන්ට රැකියා අවස්ථාවන්ට වැඩි අවස්ථා ලැබී ඇත.

උසස්පෙළ කලා අංශයෙන් හැදෑරීමට ස්ත්‍රීන් වැඩි කැමැත්තක් දක්වන අතර විශ්ව විද්‍යාලයට ඇතුළත්වන පුද්ගලයින්ගෙන් 60% ක් කාන්තාවන් වීමද ඉන් කලා උපාධි සඳහා යොමු වන්නන්ගෙන් 78%ක් කාන්තාවන් වීමද විශේෂත්වයකි.තවද කලා උපාධිධාරින්ගේ රැකියා නියුක්තිය 32.1%[1] ක් පමණ වන බව නිරීක්ෂණය වී ඇති බැවින්,කාන්තාවන් ඉහළ අධ්‍යාපනයේදී කලා උපාධියට යොමු වීම උගත් ස්ත්‍රී සේවා වියුක්තිය ඉහළ යාමට හේතු වී ඇති බව පැහැදිලි වෙයි.

| සේවා තත්ත්වයන් | සමස්තය | ස්ත්‍රී පුරුෂ භාවය | |
|---|---|---|---|
| | | පුරුෂ | ස්ත්‍රී |
| සමස්තය | 100 | 100 | 100 |
| රාජ්‍ය සේවකයන් | 14.4 | 12.3 | 18 |
| පෞද්ගලික සේවකයන් | 43.3 | 46.4 | 37.7 |
| සේව්‍යයන් | 3 | 4.1 | 1.1 |
| ස්වයං ව්‍යාපාරිකයන් | 31.3 | 34.5 | 25.6 |
| ගෙවීමක් නොලද පවුලේ ශ්‍රමිකයන් | 8 | 2.6 | 17.7 |

මූලාශ්‍ර : KLIM 05/06 වන ප්‍රකාශනය - ජාත්‍යන්තර කම්කරු සංවිධානය
*ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව-LFS (2017)*

[1] www.mohe.gov.lk-overall final report

## ඉහළ අධ්‍යාපනයක් ලැබූ කාන්තාවන්ට රැකියා අවස්ථා



*දියුණුවෙමින් පවතින සහ දියුණු රටවල මෙන්ම අධ්‍යාපන අවස්ථා ලබා දෙන විට ශ්‍රම වෙළඳපොළට සරිලන විෂය පථයක් ආවරණය කළ යුතුයි.

*ශ්‍රී ලංකාවේ වර්තමාන සහ අනාගත ශ්‍රම වෙළඳපොළ තුළ නිපුණතාවයෙන් යුතු ශ්‍රමිකයන්ගේ හිඟයකට ලක් නොවීමට නම් කාන්තා ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය වැඩි කළ යුතුයි.

*කාන්තාවන් සඳහා ප්‍රමාණවත් හිතකර රැකියා තත්ත්ව නිර්මාණය කළ යුත්තේ ජාතික මට්ටමේ ප්‍රතිපත්ති තුළිනි.

*කණ්ඩායමක් ලෙස වැඩ කිරීම, වාචික සන්නිවේදනය, ලිඛිත සන්නිවේදනය, කළමනාකරණ වගකීම්, සැලසුම් කිරීම සහ සංවිධානය කිරීම, විදේශීය භාෂාව පිළිබඳ දැනුම වැනි නිපුණතා සංවර්ධනය පාසල් අධ්‍යාපනය තුළින්ම සිදු කිරීම සහ ස්ත්‍රී අධ්‍යාපන මට්ටම සහ රැකියා වියුක්තිය අතර පරතරය නැති කල යුතු අතර ආර්ථිකය සහ ස්ත්‍රීන් අධ්‍යාපනය සඳහා දරන ආයෝජනයේ ප්‍රතිලාභ ලබා ගැනීමට ස්ත්‍රීන්ට ආර්ථික කටයුතු සඳහා නියැලීමට ඇති බාධා ඉවත් කළ යුතුයි.

* ස්ත්‍රී ශ්‍රම බලකා සහභාගීත්වය ඉහළ නැංවීම තුළින් නිෂ්පාදන සාධකයක් ලෙස ශ්‍රම සැපයුම වැඩිවීම මෙන්ම ස්ත්‍රී පුරුෂ විවිධත්වය තුළින් දක්නට ලැබෙන නව හැකියා සහ කුසලතා මඟින් ශ්‍රම බලකායේ ගුණාත්මක බවද වර්ධනය කිරීමට හැකියාව ලැබෙයි.